# වෘත්තයක කෝණ

## 31.1 කාර්ය පත්‍රිකාව

01 එක් එක් වෘත්තයේ විශේෂ කොට දක්වා ඇති අංගයට ගැලපෙන සුදුසු වචනය යාකරන්න.



- ජ්‍යාය
- මහාවෘත්ත ඛණ්ඩය
- කේන්ද්‍රය
- සුළුචාපය
- විශ්කම්භය
- සුළු වෘත්ත ඛණ්ඩය
- අරය
- මහා චාපය

- පෙළ පොතෙහි 162,163 පිටු හොඳින් කියවන්න.

02 I. අරය 5cm වන වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය o ලෙස නම් කරන්න.

II. සුළු චාපයක් හා මහා චාපයක් ලැබෙන පරිදි වෘත්තය මත X, Y ලක්ෂ්‍ය 02 ක් ලකුණු කරන්න.

III. XY සුළු චාපය මගින් කේන්ද්‍රයේ ආපාතනය කරන කෝණය $X\hat{O}Y$ අඳින්න.

IV. XY සුළු චාපය මගින් වෘත්තයේ ඉතිරි කොටසේ (පරිධිය මත) ආපාතනය කරන කෝණය $X\hat{P}Y$ වන පරිදි P ලක්ෂ්‍ය වෘත්තය මත ලකුණු කරන්න.

V. ඉහත පියවර 04 ම අනුගමනය කරමින් තවත් එවැනි රූප සටහනක් අඳින්න.

කෝණමානයෙහි ඡායා පිටපතක් රැගෙන එන්න.

# වෘත්තයක කෝණ

## 31.2 කාර්ය පත්‍රිකාව

1. අරය 4.5 cm වන වෘත්තයක් අඳින්න.
2. එම වෘත්තය සුළු චාපයක් හා මහා චාපයක් ලැබෙන පරිදි A,B ලක්ෂ්‍ය 02 ලකුණු කරන්න.
3. A,B ලක්ෂ 02 යා කර ජ්‍යාය අඳින්න.
4. එම ජ්‍යායෙන් දෙපස කොටස් 02 හඳුන්වන නම් ලියන්න.
5. එම වෘත්තයේ මහා චාපය මත C,D හා E ලක්ෂ්‍ය තුනක් කැමති පරිදි ලකුණු කරන්න.
6. එම එක් එක් ලක්ෂ්‍යයන් A හා B ලක්ෂ්‍ය 02 ට යාකරමින් $A\hat{C}B$ $A\hat{D}B$ හා $A\hat{E}D$ ලබා ගන්න.
7. 6 වන පියවරේදී ඔබට ලැබුණු රූප සටහන මෙන් තවත් රූප සටහනක් අඳින්න.

## 31.3 කාර්ය පත්‍රිකාව




1. ඉහත රූපයේ ඇඳ ඇති AB රේඛා ඛණ්ඩය කිනම් නමකින් හැඳින්වේද?

2. AB රේඛා ඛණ්ඩයෙන් දෙපස පිහිටි චාප 02 පිළිබඳව කුමක් කිවහැකිද?

3. AB රේඛා ඛණ්ඩයෙන් එක් පසක පිහිටි කොටස එම වෘත්තයෙන් කිනම් භාගයක්ද? එය කුමන නමකින් හැඳින්වේ ද?

4. පෙළ පොතේ 179, 180 පිටු හොඳින් කියවා $A\hat{C}B$ හඳුන්වන නම ලියන්න.

5. කුඩා කඩදාසි කැබැල්ලක් ගෙන දෙකට නවන්න. නැමුම් දාර සමපාත වන පරිදි නැවතත් දෙකට නවන්න. සෘජු කෝණ මුල්ලක් ලබාගන්න.

6. ඉහත ලබාගත් සෘජුකෝණ මුල්ල භාවිතයෙන් ඉහත $A\hat{C}B$ කුමන වර්ගයේ කෝණයක් දැයි නිරීක්ෂණය කරන්න.

7. කෝණමානය භාවිතයෙන් $A\hat{C}B$ විශාලත්වය මැන සටහන් කරන්න.

8. C ලක්ෂය පිහිටන චාප කොටස මත ම D ලක්ෂායක් ලකුණු කර $A\hat{D}B$ ලබා ගන්න. $A\hat{D}B$ සඳහා ද 6,7 පියවර අනුගමනය කරන්න. ඔබේ නිගමනය ලියන්න.